# ශ්‍රී ලංකාවේ පාසල් හා දෙමාපියන් අතර සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

(හලාවත අධ්‍යාපන කලාපය ඇසුරෙන්)

එස්. ටී. කමලා ඥානසෞන්දරි,

ශාස්ත්‍රවේදී ,

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,

අධ්‍යාපනපති,

ලි. ප. අංකය 94 / M phil / 16

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාවේ අවශ්‍යතා පූරණය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි.

**1995/1997** වර්ෂය

UCLIB
504718

අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාලය,

කොළඹ.

**2001 – 01 - 30**

University of Colombo
Library
Sri Lanka

## සංක්ෂේපයෙන් —


දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසල සහ නිවස යන දෙකම එක සේ වැදගත් වේ. දරුවන් පාසලේ දී ලබන අධ්‍යාපනය වඩාත් සාර්ථක වන්නේ ඔවුන්ට නිවෙස් පරිසරයෙන් ලැබෙන අනුබලය හා දිරිගැන්වීම අනුව ය. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන කටයුතු වලට දෙමාපියන් හවුල් කර ගැනීමට 1930 ගණන් වල සිට විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රයත්න දරනු ලැබුව ද තවමත් බොහො පාසල් වල එම සම්බන්ධතා ප්‍රමාණවත් අයුරින් ගොඩනැගී ඇතැයි කිව නො හැකි ය.

වර්ෂ 1992 දී නිකුත් කරන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව මගින් ද, පාසල් සම්බන්ධයෙන් දෙමාපිය සහභාගීත්වය අප්‍රමාදව ගවේෂණය කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ විරල ය. එහෙයින් පාසල හා දෙමාපියන් අතර සම්බන්ධතාව පිළිබඳව කෙරෙන මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ඵලදායී මෙහෙවරක් කළ හැකි යයි අපේක්ෂා කෙරේ.

නිබන්ධනයේ පළමුවැනි පරිච්ඡේදය පර්යේෂණයට මුල් වූ ගැටලුව හැඳින්වීම සඳහා වෙන් විය. දෙවැනි පරිච්ඡේදය යොදා ගනු ලැබුවේ අදාළ පර්යේෂණ සාහිත්‍යය විමර්ශනය කිරීම සඳහා ය.

තුන්වෙනි පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ ක්‍රම පිළිවෙත විස්තර කරන ලදී. පාසල හා දෙමාපියන් අතර සම්බන්ධතාවේ ස්වභාවය පිරික්සා බැලීම, පාසල සමග සම්බන්ධ වන දෙමාපියන්ගේ ක්‍රියාකාරිත්වය සොයා බැලීම, දරුවන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සම්බන්ධයෙන් සහ පාසලේ භෞතික සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් දෙමාපිය දායකත්වය විමසා බැලීම, පාසලේ දෙමාපිය සම්බන්ධතා කළමනාකරණ ක්‍රියා පිළිවෙත් හා දෙමාපිය සහභාගීත්වය අතර සම්බන්ධතාවේ ස්වභාවය පිරික්සීම සහ පාසල හා දෙමාපියන් අතර සම්බන්ධය ශක්තිමත් කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම පර්යේෂණයේ අරමුණු විය.

මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලද්දේ හලාවත අධ්‍යාපන කලාපය තුළ ය. එහි වූ පාසල් එකසිය හැට අටෙන් පාසල් වර්ගීකරණය පදනම් කරගෙන ස්ථරායන නියැදි ක්‍රමය අනුව පාසල් විස්සක් තෝරා ගැනිණි. එම පාසල් වල සේවය කළ ගුරුවරුන් දෙසිය දෙනෙකු සහ එම පාසල් වල සිසුන් ගේ දෙමාපියන් දෙසිය අසූ දෙනෙකු අහඹු ලෙස තෝරා ගන්නා ලදී. පාසල් විස්සේ විදුහල්පතිවරුන් ද ඇතුළුව නියැදියට අයත් මුළු සංඛ්‍යාව පන්සියයක් විය ගුරුවරුන් සහ දෙමාපියන්ගෙන් ප්‍රශ්නාවලි මගින් ද, විදුහල්පතිවරුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද, දෙමාපියන් සහභාගි වන අවස්ථා නිරීක්ෂණය කිරීමෙන් ද දත්ත රැස් කර ගන්නා ලදී. සමීක්ෂණ පර්යේෂණ සඳහා වඩාත් යෝග්‍ය වන විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මෙහි දී අනුගමනය කෙරිණි.

**සිව් වැනි පරිච්ඡේදය යොදා ගනු ලැබුවේ දත්ත විශ්ලේෂණය** ඉදිරිපත් කිරීම සඳහා ය. පර්යේෂණයට ලක් වූ පාසල් වල දෙමාපියන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලබාගත් දත්ත, පාසල් වර්ගීකරණය අනුවත්, ගම්බද/නාගරික වශයෙන් පාසල් වල පිහිටීම අනුවත්, දෙමාපියන්ගේ රැකියා මට්ටම් සහ අධ්‍යාපන මට්ටම් අනුවත් විශ්ලේෂණය කරන ලදී. මෙහි දී ප්‍රධාන වශයෙන් ප්‍රතිශත ක්‍රමය උපයෝගී කර ගන්නා ලද අතර වගු සහ ප්‍රස්තාර අවශ්‍ය තන්හි යොදා ගැනිණි.

1AB වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් වල වැඩි දෙමාපිය සහභාගිත්වයක් පැවති බව පර්යේෂණයෙන් පෙනී ගිය අතර දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව ද, පාසලට අවශ්‍ය භෞතික සම්පත් සැපයීම සම්බන්ධයෙන් ද, එම දෙමාපියන් වැඩි උනන්දුවක් දක්වන බව පෙනුණි. දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු සම්බන්ධයෙන් ගම්බද පාසල්වලට දරුවන් එවන දෙමාපියන්ට වඩා නගරබද පාසල් සිසුන්ගේ දෙමාපියන් වැඩි සැලකිල්ලක් දක්වන බව අනාවරණය විය. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට දක්වන උනන්දුව සම්බන්ධයෙන් දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සහ රැකියා මට්ටම් බලපාන බව නිගමනය කළ හැකි විය.

දෙමාපියන් පාසලට සහභාගි කර ගැනිමට පාසල් මගින් යොදා ඇති කලමනාකරණ ක්‍රියා පිළිවෙත් සහ දෙමාපිය සහභාගිත්වය අතර දැඩි සම්බන්ධතාවක් පවතින බව පෙනුණි.

පාසල හා දෙමාපියන් අතර සම්බන්ධතාව වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමෙන්, කලාපිය මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් ගත හැකි පියවර කිහිපයක් යෝජනා කිරීමට පර්යේෂණය අවසානයේ දී හැකි විය. එසේම අනාගතයේ දී පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කිහිපයක් ද හඳුනා ගැනිමට අවස්ථාව උදා විය. මෙසේ අවසන් පරිච්ඡේදයේ දී නිගමන හා යෝජනා ඉදිරිපත් කරමින් පර්යේෂණ කාර්යය නිම කරන ලදී.

අනාගත ලෝකයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි දරු පරපුරක් විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් බිහි කර ගැනිමේ කාර්යයේ දී දෙමාපිය සහභාගිත්වය අත්‍යවශ්‍ය වනු ඇත. එකී සහභාගිත්වය උපරිම ලෙස වර්ධනය කර ගැනිම සඳහා මෙම පර්යේෂණය තුළින් හෙළි කරගන්නා ලද තොරතුරු ඵලදායී ලෙස දායක වේ යයි පර්යේෂිකාව අපේක්ෂා කරයි.